# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**සිංහල භාෂාව හා සාහිත්‍යය** කාලය පැය 01½ යි.

නම / අංකය : ........................................................ 6 ශ්‍රේණිය

**I කොටස**

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන අර්ථය සහිත යෙදුම තෝරන්න.

(01) නරියා උඩ බලාගෙන හයියෙන් <u>අඬපාල</u> ඇහුවා ඇ අපේ කාට දැකුමක් ද ඔය තඩේ ගෙනියන්නෙ කියලා.

(i) ශබ්දකර (ii) හූ කියා (iii) කෑ ගසා (iv) අත්පුඩි ගසා

(02) <u>සුදුහ ගින්දරේ</u> පසුවන වැද්දන්ගේ බඩට වුවමනා කරන්නේ රසයට වඩා ආහාර ප්‍රමාණය වැඩිවීමකි.

(i) බඩගින්නෙන් (ii) වේදනාවෙන් (iii) වෙහෙසවීමෙන් (iv) දැඩි උණුසුමෙන්

- හිස්තැනට සුදුසු අක්ෂරය යොදන්න.

(03) පුස් ...... කාලය (ත, ථ)

(04) ප්‍ර .......නය (ශ්, ෂ්)

(05) "රූපය" යන පදයේ ඇති පිල්ලම කුමක්ද?

(i) දීර්ඝ ඇදපිල්ල (ii) ඇලපිල්ල (iii) ගැටපිල්ල (iv) දීර්ඝ පාපිල්ල

- විරුද්ධ පදය තෝරන්න.

(06) උණුසුම

(i) උණුවීම (ii) සීතල (iii) ගින්දර (iv) ජලය

(07) "ගුවන" යන පදයට සමානාර්ථ පදයකි.

(i) නුබ (ii) රාත්‍රිය (iii) නුඹ (iv) තරු

(08) සිංහල අක්ෂර මාලාජවේ ඇති හල් කළ නොහැකි අක්ෂරයක් වන්නේ,

(i) න (ii) ණ (iii) ට (iv) ළ

(09) සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර අක්ෂර ගණන,

(i) 10 යි. (ii) 13 යි. (iii) 18 යි. (iv) 42 යි.

(10) ප්‍රථම පුරුෂ බහු වචන නාම පදයක් වන්නේ,

(i) මම (ii) ළමයි (iii) නුඹලා (iv) අපි

- පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(11) ................................ පෙරහැර අලංකාර කරති. (ඇත්තු / ඇතුන්)

(12) ගස් සැමට සෙවණ ලබා ........................(දෙයි / දෙති)

(13) නුඹලා බිතු සිතුවම් .................... (නරඹන්නෙහි / නරඹන්නෙහු)

(14) ............................... උදෑසනින්ම සුබ පතමි (මම / මා)

(15) ................................... උනන්දුවෙන් විභාගය සමත් වෙමු. (අප / අපි)

- පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | උක්තය | අනුක්තය |
|---|---|---|
| (16) | ගැමියෝ | ....................................................... |
| (17) | ................................................... | කුරුල්ලන් |
| (18) | මම | ....................................................... |
| (19) | ................................................... | ඔවුන් |

(20) "බත් මුට්ටිය පොළොවේ ගැහුවා වගේ හිටියි." යනු,

(i) උපමාවකි. (ii) විශේෂණයකි. (iii) රූඪියකි. (iv) රූපකයකි.

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(01) සුබ පැතුම් පත් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම ඇසුරෙන් පහත් සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

I. සුබ පැතුම්පත් භාවිතා කරන අවස්ථා දෙකක් නම් කරන්න.

II. සුබ පැතුම්පතක් සකස් කිරීමේදී සැලකිය යුතු කරුණු දෙකක් නම් කරන්න.

III. සුබ පැතුම්පත නිර්මාණය සඳහා ඔබ භාවිතා කළ ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

IV. සුබ පැතුම්පත් නිර්මාණය කිරීමෙන් ඔබ ලබාගත් අත්දැකීම් දෙකක් ලියන්න.

V. සුබ පැතුම්පත් නිර්මාණය කිරීමේදී ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 2 x 5 = 10)

(02) පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

I. උදයක අසිරිය

II. වැඩිහිටියන්ට සලකමු.

III. මා ගිය අධ්‍යාපන චාරිකාව.

IV. ජලය වටිනා සම්පතකි.

V. වැසි දිනයක්.

(ලකුණු 20)

(03) ඔබ පාසලේ පැවති නිවාසාන්තර ක්‍රීඩා උත්සවය පිළිබඳව සඳහන් කරමින් වෙනත් පාසලක ඉගෙන ගන්නා ඔබගේ මිතුරෙකුට යවන ලිපියක් ලියන්න. (ලකුණු 10)

(04) පෙළ පොත ඇසුරෙන් පිළිතුරු ලියන්න.

(අ) ඉර උදා වන්නට

පළමුව නැගිට සිහිකොට

..............................................

..............................................

(I). කවිය සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02)

(II). එම කවිය ඇතුළත් කාව්‍ය කෘතිය කුමක්ද? (ලකුණු 01)

(III). එම කාව්‍ය කෘතියේ රචකයා නම් කරන්න. (ලකුණු 01)

(IV). එම කවියෙන් කියවෙන යහපත් පුරුද්දක් ලියන්න. (ලකුණු 01)

(ආ) "දුකට පත් වුණ වෙලාවක පිහිටක් ඉල්ලන යාළුවකුට හිනාවීම ඒ තරම් වැදගත් කාරියක් නෙමෙයි."

(I). මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක්ද? (ලකුණු 01)

(II). එය කාවිසින් කාහට කියන ලද්දක්ද? (ලකුණු 02)

(III). කුමන අවස්ථාවක කියන ලද්දක්ද? (ලකුණු 02)

(05) "කියවන්නෝ දිනන්නෝ" වැඩසටහනට අයත් අතිරේක පොත් කියවීමට අදාළ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න.

1)

I. "මුහුද අද්දර ගෙදර ළමයි" යන කෘතියේ කතුවරයා නම් කරන්න. (ලකුණු 03)

"ඇයි ........ අපි ලොකු බෝට්ටුවක නැගලා ගංඟාව දිගේ උඩහටත් ගියා ඔයාලට මතක නැද්ද"

II. ඉහත ප්‍රකාශය කළේ කවුරුන්ද? (ලකුණු 01)

III. එය අසා සිටියේ කවුරුන්ද? (ලකුණු 01)

2)

I. අපේ ගමේ විත්ති යන කෘතියේ රචකයා නම් කරන්න. (ලකුණු 02)

"අපි කණමැදිරියෝ අල්ලමු."

II. ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවුරුන්ද? (ලකුණු 01)

III. කාහට ද? (ලකුණු 01)

IV. එම ප්‍රකාශය අයත් කතාවේ නම කුමක්ද? (ලකුණු 01)

3)

I. "තැනිතලාවේ පිහිටි කුඩා නිවස" කෘතියේ පරිවර්තකයා නම් කරන්න. (ලකුණු 03)

"අපි දවසක් දෙකක් මෙහෙ ඉඳිමු."

II. ඉහත ප්‍රකාශය කළේ කවුරුන්ද? (ලකුණු 01)

III. කාහටද? (ලකුණු 01)

4) Peter and the Wolf

I. මෙම කතාවේ කියවෙන සිද්ධිය කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

II. එම කතාවේ එන චරිත තුන නම් කරන්න. (ලකුණු 05)